# මහාමාර්ග අමාත්‍යාංශය

## ඉංජිනේරුවන් බඳවා ගැනීම
## දේශීය බැංකු අරමුදල් හා ග්‍රාමීය මාර්ග කි. මී. ලක්ෂයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ඉදිරි වසර 05 තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත මාර්ග කිලෝමීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීමේ කටයුතු මෙහෙයවනු ලබන දේශීය බැංකු අරමුදල් හා ග්‍රාමීය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා මහාමාර්ග සංවර්ධන කාර්යයේ අත්දැකීම් සහ පළපුරුද්ද සහිත වරලත් ඉංජිනේරුවන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරු මාර්ග සංවර්ධන ක්ෂේත්‍රයේ වසර 09 ක සේවා පළපුරුද්ද සහිත වරලත් ඉංජිනේරුවරයෙකු විය යුතුය.

02. අයදුම්කරුවන් වයස අවු.60 නොඉක්ම වූ මනා ශරීර සෞඛ්‍යයෙන් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

03. ව්‍යාපෘතිවලට බඳවා ගැනීම් සඳහා අදාළ වන 2019/03/05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු 01/2019 චක්‍රලේඛයේ විධිවිධාන මේ සඳහා අදාළ වේ.

04. අයදුම්කරුවන් ලබා ඇති සුදුසුකම් හා පළපුරුද්ද සලකා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු 01/2019 චක්‍රලේඛය මඟින් නියම කර ඇති PS 04 කාණ්ඩයට අයත් වැටුප් මට්ටමහි පිහිටුවනු ඇත.

05. තෝරා ගන්නා අයදුම්කරුවන් ශ්‍රී ලංකාව තුළ ඕනෑම ස්ථානයක සේවය සඳහා එකඟ විය යුතු වේ.

06. මූලිකවම වසරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබේ. සේවයේ අවශ්‍යතාවය හා කාර්යසාධනය සලකා වාර්ෂික සේවා දීර්ඝයන් ලබාදීමට සලකා බලනු ලැබේ.

එසේම අදාළ සුදුසුකම් සහිත අයදුම්කරුවන් මේ සමග අමුණා ඇති “දේශීය බැංකු අරමුදල් හා ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා කොන්ත්‍රාත් පදනමින් ඉංජිනේරුවන් බඳවා ගැනීමට” අදාල ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කර 2021. 05. 03 දිනට පෙර ලේකම්, මහාමාර්ග අමාත්‍යාංශය, “මගනැගුම මහමැදුර”, 08 වන මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතු අතර අදාළ සහතික පත්‍රවල ඡායා පිටපත් ද අමුණා එවිය යුතුය.

ලේකම්
මහාමාර්ග අමාත්‍යාංශය